# ECHO OF HIS CALL

ECHO OF HIS CALL
REACHING NATIONS
SINCE 1969
1969 TO 2029

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX | YEAR OF OUR LORD JESUS CHRIST, 2025 DECEMBER | Issue No. 01


## ශුද්ධවූ බයිබලය

**(යෙසායා 9:2-6)**

02. අන්ධකාරයෙහි ඇවිද්දාවූ සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය. මරණ සෙවණ ඇති දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් බැබළුණේය.

03. ඔබ ජාතිය වැඩිකළසේක, ඔබ ඔවුන්ගේ ප්‍රීතිය වර්ධනය කළසේක. ගොයම් කපන කාලයෙහි සන්තෝෂවන්නාක් මෙන්ද මිනුෂ්‍යයන් කොල්ලය බෙදාගන්න කල ප්‍රීතිවන්නාක්මෙන්ද ඔව්හු ඔබ ඉදිරියෙහි ප්‍රීතිවෙති.

04. මක්නිසාද ඔහුගේ බරවූ වියගහද ඔහුගේ කරේ දණ්ඩද ඔහුගේ පීඩාකාරයාගේ යෂ්ටියද මිදියන්හි දවසේදී මෙන් ඔබවහන්සේ කඩාදැමූසේක.

05. තවද කෝලාහලයට පැමිණෙන යුද්ධකාරයාගේ සියලු යුද්ධ වහන්ද ලෙයෙහි පෙඟූ වස්ත්‍රද ගින්නෙහි දැවීමට දර පිණිස වන්නේය.

06. මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය, අපට පුත්‍රයෙක් දෙනලද්දේය; ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය, සමාදානයේ කුමාරයායයි කියනු ලබන්නේය.

# සැබෑ ආලෝකය වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගෙ අඳුර පහ කරනු ලබයි !

## THE TRUE LIGHT JESUS CHRIST WILL REMOVE YOUR DARKNESS!

*Sis. Angel*



අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ සැම දෙනාටම අසිරිමත් සුභ නත්තලක් වේවා කියා ප්‍රාර්ථනා කරමු!

බොහෝ අය අද නත්තල සමරන්නට අවශ්‍යද? නැද්ද? කියා තර්ක කරයි. "සැබවින්ම යේසුස්වහන්සේ දෙසැම්බර් 25 ඉපදුණේද?" කියා අපි අසමු. නමුත් මේ දේ ගැන අපගේ අවධානය යොමු කළ යුත්තේ; දෙවියන්වහන්සේ මේ ලෝකයට මනුෂ්‍යයෙක් ලෙස පැමිණ අපට ගැලවීම දෙන පිණිස කුරුසියක්වූ බවත් ඒ පිණිස යේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණි බවත් අප අන් අයට ප්‍රකාශ කළයුතුයි.

නත්තල යනු සාන්තු සවාරි යාමත් සැරසිලි කිරීමත් නත්තල් සියාවවත් නොවෙයි. මේවා චාරිත්‍ර පමණි. නමුත් නත්තල කියා අප අර්ථවත් කරනු ලබන්නේ; ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමේ අරමුණ අප ලෝකයට එළිදරව් කිරීමයි.

*අන්න ඒ ජාතීන්ට එළිදරව් කිරීමට ආලෝකයක් පැමිණුනේය.... ලූක් 2:30* යේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක;

*මා ලෝකයෙහි සිටින කල මම ලෝකයේ ආලෝකයව සිටිමි. යොහාන් 9:5* නත්තල යනු මේ මහත් ආලෝකය ගැන සැමරීමයි.

අප දේව වචනය තුළ මේ මහත් ආලෝකයේ ගැන කුමක් කියනවාද කියා බලමු:

පොළොව වනාහි පාළුව හිස්ව තිබුනාය. ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්වහන්සේගේ ආත්මය ජල මතුයෙහි හැසිරීමෙන් සිටි සේක.

3 වෙනි පිටුව ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

★ Please Subscribe and Share ★

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

ECHO OF HIS CALL REACHING NATIONS SINCE 1969 · 1969 TO 2029



## *from your dearly beloved brother...*



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**HON. EDITOR-IN-CHIEF**
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
**EX MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.
**GENERAL MANAGER**
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
**ADMINISTRATION**
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
**EDITORIAL BOARD**
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.
**EDITOR, PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
**E.MAIL**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
**YOUTUBE CHANNEL**
Echo of His Call

"ස්වාමින් කෙරෙහි බලා සිටින සියල්ලෙනි, ශක්තිමත් වව්; තොපගේ සිත ධෛර්යවත් වේවා" (ගීතාවලිය13:24)

**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රිය මිතුවරුනි,**


ස්වාමීන්වහන්සේගේ මහත් කරුණාව තුළින් අප මෙම වසරේ අවසානයට පැමිණ සිටිමු, අපගේ ස්වාමින් වහන්සේ මේ දක්වා අපගේ සේවයට මග පෙන්නමින් අපව ශක්තිමත් කර ආශිර්වාද කර තිබෙන නිසා අපි උන්වහන්සේට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

අපි සභාවේ නායකයින් කැදවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්ය මඩුල්ල නෙහෙමියා බයිබල් විදුහලේ ගුරු මණ්ඩලය ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල සහ අපගේ මුද්‍රණාල කණ්ඩායමද ලබන වසරේ සේවාවන් ගැන ඉතා උනන්දුවෙන් යාච්ඤා කරමින් සිටිති.



*Leaders of Youth Ministry in Main Church*

ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ ඉගෙනුම ලබන අපගේ දරුවන් බොහෝ දෙනෙක් ශාරීරක අමාරුකම් හා තවත් බොහෝ අමාරුකම් තුළින් ගමන් කරමින් සිටිති. එම පාසලේ සිටින ළමුන්ගේ පසුබිම ගැන බලන විට එය ඉතාමත්ම දුක්ඛරය. අපගේ ගුරුවරු ඉතාම අනුකම්පා සහිත හදවතකින් සහ කැපවීමෙන් යුතුව ඔවුන්ට උගන්වයි. අප ඔවුන්ගේ කැපවීම මහත් සේ අගය කරමු.



*Speech by Sister Dr. Renuka on Children's Day at our St. Paul's Matriculation School*

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) · BIBLECOR - Postal Courses (3 languages) · YouTube Ministry · Online Courses · Theological Correspondence Courses (2 languages) · Church Planting · Nehemiah Bible Colleges · Gospel Printing Press · Great Commission Partners · St. Paul's Matriculation School · Crusades · Community Development

අපගේ සභාවේ සියලුම සේවකයන් ඉතා විශ්වාසවන්තව සේවය කරමින් සිටිති. විශේෂයෙන්ම කාන්තා යාච්ඤා කණ්ඩායම පුරුෂ යාච්ඤා කණ්ඩායම, සර්ව රාත්‍රී යාච්ඤා කණ්ඩායම, නිරාහාර යාච්ඤා කණ්ඩායම, සබත් පාසල් ගුරුවර ගුරුවරියන්, කරුණා සේවය යන සියලු දෙනාම ඉතාමත් ඕනෑකමින් යාච්ඤාවෙහි යෙදී සිටිති. අපගේ සේවයේ වර්ධනය උදෙසා කැපවීමෙන් ඔවුන් යාච්ඤා කරති.



*Fasting Prayer team*

අපි ඔබටද අපගේ යාච්ඤා සේවයට සහභාගී වෙන්න කියා ආරාධනා කරමු.

මෙම මාසයේදී ශුභාරංචිය නොගිය ස්ථානවල සේවය පිණිස විවිධ වැඩසටහන් සූදානම් කර තිබේ. ඒ සම්බන්ධව ඔබගේ යාච්ඤාව අපි බලාපොරොත්තු වෙමු.

එසේම ඔබගේ විශ්වාසවන්ත යාච්ඤාව නිසා ස්තූතියි. ඔබ මාසිපතා කරන්නාවූ උපකාරයන් නිසාද විශේෂයෙන්ම විශේෂ දීමනා නිසාද නැවත ඔබට ස්තූති කරමු. 2025 වන වසර මුළුල්ලේම ඔබ කළා වූ මේ සෑම උපකාරයන් නිසා නැවත වරයක් අප ඔබට ස්තූති කරමු. ඔබ අපට බලවත් ආශිර්වාදයකි. ඔබගේ යාච්ඤාවත් උපකාරයත් දිගටම කරයි කියා අප බලාපොරොත්තු වෙමු.

මේ නත්තල් සමයේදී ඔබ සැම දෙනාටම ප්‍රීතිමත් නත්තලද ආශිර්වාදමත් 2026 වන නව වසරක් වේවාද කියා ප්‍රාර්ථනා කරමු.

ස්වාමීන්වහන්සේ ඔබ සැම දෙනාටම ආශිර්වාද කරන සේක.

*In Christ Jesus, your servant,*


**Pr. S. Sam Selva Raj,** E.mail : sam@echoofhiscall.org

1 පිටුවෙන්....

උත්පත්ති 1:2 ලෝකය පටන් ගැන්මේදීත් අන්ධකාරය පොළොව වසාගෙන තිබුණි. එහෙත් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ඊට ඉහළින් ක්‍රියා කළේය.

*අන්ධකාරයෙන් එළිය වෙන් කොට එළියට දවාලේ කියාද අන්ධකාරයට රාත්‍රිය කියාද නම් තැබූ සේක. යොහාන් 1:5 වෙනත් පරිවර්තනයන් වල මෙය තවත් අලංකාරව ප්‍රකාශ කරයි.*

*අන්ධකාරයට ආලෝකය ඉදිරියෙහි සිට ගැනීමට නොහැකිය. (NLT)*
*ආලෝකය තිබෙන ස්ථානයෙහි අන්ධකාරය දුරුවන්නේය (KJV)*
*ආලෝකයත් අන්ධකාරයත් අතර සටනක් නැත. (AMP)*



***Darkness that flees from the light***

ආලෝකය පැමිණෙන විට අන්ධකාරය පහව ජයග්‍රහණය කරනු ලබයි.

## 1). පාපය මැද ආලෝකය බබලයි.

මිනිස් සමාජය පාපය නිසා දෙවියන් වහන්සේගෙන් ඈත්විය. අද අප සියල්ලෝම පවිකර දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනවී සිටියි. දෙවියන් වහන්සේගේ මැවීමේ අරමුණ වූයේ මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයක් පැවැත්වීමයි. නුමුත් ඒදන් උයනේදී මනුෂ්‍යයා පව් කළ නිසා එම සම්බන්ධතාවය කඩා බිඳ වැටුණි. එබැවින් දෙවියන්වහන්සේත් මනුෂ්‍යයාත් අතර විශාල පරතරයක් ඇති විය.

කොපමණ සතුන් පූජා කරනු ලැබුවත්, අපගේ පාපයට මිදීමක් නැත. මනුෂ්‍යයාගේ මෙම පාපයට සමාව ලබා ගැනීමට හැකිවන්නේ කැලලක් නැති බැටළු පැටවාණන් වහන්සේගේ පූජාව තුළින්ම පමණි. එම බැටළු පැටවාණන් වන්නේ යේසුස්වහන්සේය.

යේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණුනේ; පාපය කරණ කොටගෙන කැඩුනාවූ බිඳුනා වූ සම්බන්ධතාවය නැවත දෙවියන්වහන්සේ සමග ගොඩනැගීමටයි. උන්වහන්සේගේ රුධිරයේ වැගිරීම කරණ කොටගෙන අපට පාපයෙන් නිදහස ලැබීමටත් නිර්භීතකමත් උන්වහන්සේ වෙතට යාමට මාර්ගයත් ලැබුණි. යක්ෂයා ඉතාම වැරදි අදහස් දෙමින් ලෝකය මුලා කරන පිණිස බොහෝ අයගේ ඇස් අන්ධකර තිබේ. ආත්මික අන්ධකාරයට ලෝකයාව ඇතුළු කර තිබේ. මේ අඳුරෙන් එළියට පැමිණීමට නම්; දෙවියන්වහන්සේ අපට දුන් ආලෝකය අවශ්‍යය.

ස්වාමීන්වහන්සේගේ ආලෝකය අපගේ හදවත් තුළ බැබලේවා. අපිටත් දෙවියන් වහන්සේටත් අතර තිබෙන සෑම බාධාවක්ම ඉවත් කර ස්වාමීන් වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවය තුළින් ගමන් කිරීමට ස්වාමීන් වහන්සේ අපට උපකාර කරන සේක.



***We need the light of God***

## 2). අඳුරේදී ආලෝකය බැබලෙයි!

අප දකින්නේ සෑම දිශාවෙන්ම අන්ධකාරය, යුද්ධයන්, දිළිඳුකම, භීෂණය, අපරාධ ක්‍රියා එකිනෙකාට වෛර කිරීම, තරුණ තරුණියන් බලාපොරොත්තු රහිතව ජීවත්වීම, සමහරු තමාගේ ජීවිතය නැති කරගැනීම ආදියයි. අද සමාජය තුළ පාපය උසස් කරමින් ධර්මිෂ්ඨකමට පහර දෙයි. අද මේ ලෝකය දිනපතාම අඳුරෙන් අඳුරට ගමන් කරන බව අපි දකිමු.

අපගේ වැඩිහිටියන් අද නිතරම පවසන්නා වූ දේ නම්; "අපේ කාලේ මේ වගේ දේවල් තිබුණේ නැහැ. එදා ගොඩක් දේවල් බොහෝ වෙනස්ව තිබුණා." කියා පවසයි. අධ්‍යාපනය, තාක්ෂණය ආදී දේවල් අද සමාජයට විවෘත කර දී තිබේ. නමුත් ඒ දේවල් දෙවියන් වහන්සේගෙන් නොවෙනු ඇත.

දේව වචනයෙහි අපට අන්තිම කාලය ගැන අවවාද දෙනදෙයි. *"නමුත් අන්තිම දවස් වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව දැනගනින්න. මක්නිසාද මිනුෂ්‍යයෝ තමුන්ටම ප්‍රේම කරන්නෝය, මුදලට ප්‍රේම කරන්නෝය, පාරට්ටු කරගන්නෝය, උදාරම් කාරයෝය, අපහාස කරන්නෝය, මවුපියන්ට අකීකරු වන්නෝය, ස්තුතිවන්ත නොවන්නෝය, අභක්තිකයෝය, ජන්ම ස්නේහය නැත්තෝය, සමාදාන නොවන්නෝය, කේලම් කියන්නෝය, තෘෂ්ණාව මැඩ පවත්වා නොගන්නෝය, කෲරයෝය, යහපතට ප්‍රේම නොකරන්නෝය, ද්‍රෝහීයෝය, හිතුවක්කාරයෝය, අහංකාරයෝය, දෙවියන් වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේම කරන්නෝය, දේව භක්තියේ වේශය දරන නුමුත් එහි බලය එපා කළ අයව සිටින්නෝය. මෙබඳු අයගෙන් අහක් වෙයන්න." (2 තිමෝති 3:1-5)*

මේ සියල්ලම ප්‍රකාශ කර, පාවුලු තුමා පවසන්නේ; මේ අය සමග කිසිම සම්බන්ධතාවයක් පවත්වා නොගන්න කියාය.

ලෝකයෙහි අඳුර බොහෝ වුවත් ඔබ දෙවියන් වහන්සේගේ මහිමය සඳහා බැබලෙන්නා වූ පුද්ගලයෙක් විය යුතුයි.



**The people living in darkness have seen a great light**

*"අන්ධකාරයෙහි හුන් සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය. මරණයේ දේශයෙහිද සෙවණෙහිද හුන්නා වූවන්ට ආලෝකය උදා වූයේය." (මතෙව් 4:16)*

මේ නත්තල් සමයේදී දෙවියන් වහන්සේ ආලෝකමත්ව සෑම අඳුරු ස්ථානයකම බැබලේවා කියා මා ප්‍රාර්ථනා කරමි. එපමණක්ද නොව, අපගේ පවුල්වලද අපගේ ප්‍රදේශවලද අපගේ ජීවිත තුළද අප රැකියා කරන්නාවූ ස්ථානවලද අපගේ දරුවන් අතරද අපගේ විවාහය තුළද අපගේ නීරෝගීකමේද අධ්‍යාපනයේද මුදල්මය අංශයන්වලදීද යන මේ සියලු දේ තුළින් අඳුර පහ වී දෙවියන් වහන්සේගේ ආලෝකය බැබලේවා.

අපට විරුද්ධව කතා කරන්නාවූ අය සහ අප පිළිබඳව අශුභවාදී ප්‍රකාශකරන වෛද්‍යවරු, ඥාතීන්, නායකයින් යන අයගේ එම අශුභවාදී කතාවල තිබෙන්නාවූ බලය දෙවියන් වහන්සේගේ ආලෝකයෙන් දුරුවේවා කියා මා ප්‍රාර්ථනා කරමි.

අප මෙම වසර නිමා කර නව වසරට ඇතුළු වන කල්හි යේසුස්වහන්සේ තුළ තිබෙන්නා වූ ඇදහිල්ල කරන කොටගෙන අප ඉදිරියටම ගමන් කළ යුතුයි.

*"එසේය ඔබ මාගේ පහන දල්වන සේක. මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ මාගේ අන්ධකාරය ආලෝක කරනසේක." (ගීතාවලිය 18:28)*

## 3). බියක් තිබෙන ස්ථානයේදී ආලෝකය බැබලෙයි!

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත ගැන දේවදූතයින් එඬේරුන්ට දුන් ශුභ පණිවිඩය නම්; "බිය නොවන්න." කියාය.

*"එවිට ස්වාමීන් වහන්සේගේ දූතයෙක් ඔවුන් ළඟ සිටියේය. ස්වාමීන් වහන්සේගේ තේජස ඔවුන් අවට බැබළුණේය. ඔවුහු අතිශයින් බියපත් වූහ. දේවදූතයා ඔවුන්ට කතාකොට: බිය නොවෙල්ලා; බලව, මුළු සෙනගට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි." (ලූක් 2:-9-10)*

එදින රාත්‍රියේදී අහසෙන් ආලෝකයක් දුටු විට එඬේරුන් බියට පත්විය. මරියාද ගබ්‍රියෙල් දේවදූතයා පැමිණි කල බිය විය.

*"නමුත් ඈ ඔහුගේ කීමට බොහෝ සේ කැළඹී, මේ කෙබඳු වූ ආශ්චර්යයක්ද කියා කල්පනාකරමින් සිටියාය. දේවදූතයා ඈට: කතාකොට මරියා, භය නොවන්න. මක්නිසාද නුඹට දෙවියන් වහන්සේගෙන් කරුණාව ලැබුණේය." (ලූක් 1:29-30)*



***Do not be afraid, Mary...***

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

අපගේ ලිපිනය:

**ECHO OF HIS CALL,**
**10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India**
**Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: mm@echoofhiscall.org**

ඉදිරියේදී තැදවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව තැදවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**දෙසැ:19** - අපගේ පරිවර්තකයින්, සහකාරය සංස්කාරකවරුන් සම්බන්ධීකාරකවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කළනිසා ස්තුති කරන්න.

**දෙසැ:20**- අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විද්‍යාල සහ දේවධර්මය පාඨමාලාව යන සියලු සේවාවන්වල අඩු අවශ්‍යතා සපුරා දුන් නිසා ස්තුති කරන්න.

**දෙසැ:21** - අපගේ යාච්ඤා හවුල්කරුවන් දායක හවුල්කරුවන් ඇදහිල්ලේ හවුල්කරුවන් ජීවිත කාලය පුරා හවුල්කරුවන් සහ මහා නියෝගයේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල්වලට දෙවියන්වහන්සේගේ කරුණාව ලබාදුන් නිසා ස්තුති කරන්න.

**දෙසැ:22**- අපගේ නොයෙකුත් සේවාවන් හරහා ළඟා නොවූ ආත්මයන් වෙත ළඟා වීමට අපට උපකාර කළ නිසා ස්තුති කරන්න.

**දෙසැ:23** - අපගේ දේව සේවයේ නිරතව සිටින දාස දාසියන්ගේ පවුල්වලට උන්වහන්සේ බලවත් ලෙස ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**දෙසැ:24**- දෙවියන්වහන්සේගේ ආශිර්වාදය අපගේ සේවකයින්ගේ පවුල්වලට වැගිරෙව් නිසා ස්තුති කරන්න.

**දෙසැ:25**- මෙම වසරේ අපගේ සියලුම නත්තල් සැමරුන්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**දෙසැ:26**- අප සැම දෙනාවම මුදවා ගැනීමට පැමිණි ලෝකයේ ගැලවුම්කරවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත නිසා ස්තුති කරන්න.

**දෙසැ:27**- අපගේ ප්‍රධාන පාලකතුමා සහ ඔහුගේ පවුලේ අයට දිව්‍ය ආරක්ෂාව සහ සියලු ආකාරයේ නපුරු බලවේගයන්ගෙන් ඔවුන් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න

**දෙසැ:28**- ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල පවත්වන ඉරුදින පාසල සඳහා නවත් අලුත් දරුවන් අපට ලබාදී ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න

**දෙසැ:29**- මෙම වසර පුරාම දෙවියන් වහන්සේගේ සේවකයින්ට දිව්‍ය ආරක්ෂාව ලබාදුන් නිසා ස්තුති කරන්න.

**දෙසැ:30**- මෙම වසර පුරාම ක්‍රිස්තියානි සංවිධානවල සුමට හා ඵලදායී ක්‍රියාකාරීත්වය නිසා ස්තුති කරන්න.

**දෙසැ:31** - 2025 වන වසර සඳහා අපගේ සියලු අවශ්‍යතා ඉතා ආශ්චර්යමත් ලෙස සපුරා දුන් නිසා නිසා ස්තුති කරන්න.

**ජන:01**- 2026 වන වසර පුරාවටම ලෝකය පුරා විසිරී සිටින සියලුම නායකයින්ට සහ ජනතාවට සාමය ප්‍රාර්ථනා කරමු.

**ජන:02**- දෙවියන් වහන්සේ අපගේ ප්‍රධාන ස්වභාවය සහ ශාඛා සභාවන්වල ඇදහිලිවන්තයින්ට ආශිර්වාද කළ නිසා ස්තුතිය පුද කරමු.

**ජන:03**- 2026 වන වර්ෂයට සියලුම සභාවන් සහ ඇදහිලිවන්තයින්ට යහපත් පොරොන්දු වලින් ආශිර්වාද කරමු.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජන:04**- කනන්ඩා හි සිටින අපගේ සහකාර කර්තෘ ගරු ආර්. රාම ක්‍රිෂ්ණා සහ ඔහුගේ බිරිඳට අසනීප තත්ත්වයෙන් පසු වන නිසා ඔවුන්ට ඉතා ඉක්මනින් සුවය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:05:** ලෝකයේ සිටින්නා වූ සියලු නායකයින්ට දිව්‍ය ප්‍රඥාව ලැබෙන පිණිසත් ඔවුන්ට ජනතාවගේ සුභසාධනය සඳහා කටයුතු කිරීමට මග පෙන්වීම පිණිස යාච්ඤා කරන්න

**ජන:06**- අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ සහ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ ඉගෙනුම ලබන සියලු සිසුන්ට දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:07**- අපගේ ආයතනයේ සේවයට සුදුසු සේවකයින් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:08**- කිතුනුවන් දෙවියන් වහන්සේගේ වචනය අනුගමනය කර ඔවුන් ක්‍රිස්තුස් වහන්සේට සමාන චරිතයක් අනුව ජීවත් වන පිණිස යාච්ඤා කරන්න.

**ජන:09**- මෙම මාසයේ අපගේ අවශ්‍යතා සඳහා දෙවියන්වහන්සේගේ සැපයීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:10**- අපගේ සේවයේ හවුල්කරුවන් සහ රාජ්‍ය සම්බන්ධීකාරකවරුන්ගේ සේවාවන්වල සාර්ථකත්වයක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ජන:11**- අපගේ දේව සේවය පුළුල් වන පිණිස සහ ලෝකය පුරා සුභාරංචිය ප්‍රචාරණය වන පිණිස යාච්ඤා කරන්න.

**ජන:12**- 2026 වන වර්ෂයේදී දේවගැති එස්. පෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු සාමාජිකයන් දෙවියන් වහන්සේගේ බලවත් හස්තය යටතේ ගෙනයන පිණිස යාච්ඤා කරන්න.

**ජන:13**- සියලුම සභාවන් වලට විරුද්ධව ක්‍රියා කරන්නාවූ බලවේගයන්ට එරෙහිව දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:14** - සියලු රටවල් අතර සාමය ඇතිවන පිණිස සහ ආර්ථික සංවර්ධනයක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ජන:15**- ලොව පුරා ව්‍යාප්තව තිබෙන සියලුම කිතුනු අධ්‍යාපනික සංවිධානවල උසස් ප්‍රමිතියක් හා යහපත් කීර්තියක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ජන:16** - සියලුම සභාවන් සහ කිතුනු සංවිධානය රජය සමඟ නීත්‍යානුකූලව ලියාපදිංචි වන පිණිස යාච්ඤා කරන්න.

**ජන:17**- අපගේ යාඥා හවුල්කරුවන් දායක හවුල්කරුවන් ඇදහිල්ලේ හවුල්කරුවන් ජීවිත කාලය පුරාවටම හවුල්කරුවන් මහා නියෝගයේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:18**-- 2026 වන වර්ෂයේදී ලෝකය පුරාම යහපත් සෞඛ්‍යයක් සහ සාමය හා සමෘද්ධියක ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

අපගේ ජීවිතයේද බිය කියන දෙය සැබෑ දෙයකි. නමුත් මේ බිය අප තුළින් පහවිය යුතුයි. යේසුස් වහන්සේගේ ආලෝකය අප තුළට පැමිණෙන විට ඒ බිය පහවෙයි. මන්ද දෙවියන්වහන්සේ ඉදිරියෙහි අප ඉතා අනර්ඝයි. අපගේ බිය පසෙකට දමා මරියා දෙවියන්වහන්සේට ප්‍රතිචාරය දැක්වූ ලෙස අපද දෙවියන් වහන්සේට ප්‍රතිචාරය දැක්විය යුතුයි.

*"මරියාද බැලුව මැනව, ස්වාමින්වහන්සේගේ දාසිය; ඔබගේ වචනය ලෙස මට වේවායි කීයවාය. එවිට දේවදූතයා ඈ කෙරෙන් ගියේය." (ලූක් 1:38)*



**When we surrender to God's authority, every promise will come to pass**

දෙවියන්වහන්සේගේ ආධිපත්‍යයට අප යටත් වන විට උන්වහන්සේ අපට කතාකර පොරොන්දු වූ සෑම දේම සැබෑ තත්ත්වයට පත්වෙයි. බිය නොවන්න, ස්නාවල ස්වාමින්වහන්සේ ඔබ ඉදිරියෙන් යන සේක. ඔබට විරුද්ධව තිබෙන්නාවූ සියලුම සටන් වලදී උන්වහන්සේ සටන් කරන සේක. උන්වහන්සේට කදිනු ඉල්ලා ගන්න. උන්වහන්සේ ඔබව සැනසෙයි.

## 4). ඔබගේ ඊළඟ පියවර පෙන්වන පිණිස ආලෝකය බැබලෙයි!

අපගේ අනාගතය ගැන අප බිය නොවිය යුතුයි. මන්ද ස්වාමීන් වහන්සේ අපට මග පෙන්වන ස්වාමීන් වහන්සේය.

*"ඔබගේ වචන මාගේ පාදයන්ට පහනක්ය, මාගේ මාවතට එළියක්ය." (ගීතාවලිය 119:105)*

දෙවියන්වහන්සේ අප ගමන් කරන්නාවූ මාවත ක්ෂණිකවම එළිදරව් නොකරයි. නමුත් අපගේ මාවතේ ඊළඟ පියවර තැබීමට ස්වාමීන්වහන්සේ අපට උපකාර කරයි.



**God doesn't reveal the entire road at once - but He always shows the next step**

අපගේ ජීවිතය කැළඹිලිකාර තත්ත්වයක තිබෙන විටදීත් සෑම දේම අඳුරේ ගිලී තිබෙන විටදීත්, අපි; 'ස්වාමීනි මේක මෙසේ සිදුවන්නේ ඇයි?' කියා අසනු ලබයි. නමුත් දාවිත්ගේ වචනය බලන්න;

*"එසේය, ඔබ මාගේ පහන දල්වන සේක, මාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ මාගේ අන්ධකාරය ආලෝක කරන සේක." (ගීතාවලිය 18:28)*

අප නව වසරට පා තබන කල්හි ඔබගේ පවුලටත් සේවයටත් රැකියාවටත් දෙවියන්වහන්සේගේ මගපෙන්වීම ලබා දෙන්නේ කියා ඉල්ලා සිටින්න.

**ස්වාමින්වහන්සේ ඔබගේ අනාගතයට මග පෙන්වන්න කියා උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.**

*"මා විසින් පුරාණ සෙනග පිහිටෙව් තැන් පටන් මා වගේ ප්‍රකාශ කර යමක් දන්වා පිළිවෙලට මට කියන්නේ කවරෙක්ද? ඔවුහු සිද්ධවෙන දේවල්ද පැමිණෙන්ට තිබෙන දේවල්ද දන්වත්වා." (යෙසායා 44:7)*

ප්‍රිය මිතුවරුනි, 2026 වසරට ඇතුල්වීමට පෙර අප ස්වාමින් වහන්සේගේ ආලෝකය බබළවා. ඒ ආලෝකය ස්වාමින්වහන්සේ අපගේ ජීවිතයේ උන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කිරීමටත් උන්වහන්සේගේ අරමුණ පෙනීමටත් අපට මග පෙන්වන්න කියා යාච්ඤා කරමු.

## 5). අපව ආරක්ෂා කිරීමට දෙවියන් වහන්සේගේ ආලෝකය බැබලේවා!

*"එම්බා මාගේ සතුරිය, මට විරුද්ධව ප්‍රීති නොවන්න. මම වැටුණු විට නැගිටින්නෙමි. මම අඳුරෙහි හිඳින කල ස්වාමීන්වහන්සේ මට එළියක්ව සිටින සේක." (මීකා 7:8)*

මෙය කොපමණ අනර්ඝ පොරොන්දුවක්ද? අප ලැජ්ජාවට පත් වී අධෛර්යයට පත්වී කලකිරීමට පත්වී සිටියත් අප නැවත නැගිටින බවට දෙවියන් වහන්සේ පොරොන්දු වෙයි. මන්ද ස්වාමීන් වහන්සේ අපගේ ආලෝකයයි.

2025 වන වසර සමහර විට ඔබට එතරම් යහපත් වූ වසරක් නොවන්නට ඇත. නමුත් මිනිස තබාගන්න ස්වාමීන් වහන්සේගේ උපකාරය තුළින් ඔබට නැවත නැගිටීමට පුළුවනි. ඔබට නැති වූ සියල්ලම නැවත ඔබට ලබා දීමට දෙවියන්වහන්සේට පුළුවනි. ඔබ උන්වහන්සේට විශ්වාසවන්තව සිටියහොත් උන්වහන්සේ ඔබටද විශ්වාසවන්තව සිටියි.

ඊශ්‍රායල්වරු රතු මුහුද ඉදිරියේ සිටින විටදී ඔවුන් පිටුපසින් පාරාවෝගේ සේනාව පැමිණුන නමුත් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ඔවුන්ව ආරක්ෂා කළේය.



*"ඊශ්‍රායල් වරුන්ගේ සමූදාවට පෙරටුව ගිය දෙවියන් වහන්සේගේ දූතයා අහකට ඔවුන්ට පස්සෙන් ගියේය; වලා ටැඹද ඔවුන් ඉදිරිපිටින් අහකට ඔවුන්ට පස්සෙන් සිටියේය. ඒක මිසරවරුන්ගේ සමූදාවත් ඊශ්‍රායෙල්ගේ සමූදාවත් අතරට පැමිණුනේය; මෙසේ වලාකුලද අන්ධකාරයද විය, එහෙත් එය රාත්‍රියෙහි එළිය දුන්නේය.*

**The cloud brought darkness to one side and light to the other side**

*මෙසේ මුළු රාත්‍රියෙහි එක් පක්ෂය අනෙක් පක්ෂයට ළං නොවිය." (නික්මයාම 14:19-20)*

දෙවියන් වහන්සේගේ සෙනගටත් ඔවුන්ගේ සතුරාටත් මැද ස්වාමීන් වහන්සේ සිටගත්තේය. උන්වහන්සේගේ ආලෝකයේ පැමිණ ඔවුන්ට ආරක්ෂාව ලබා දුන්නේය.

පාරාවෝගේ හමුදාවෙන් ඔවුන්ව ආරක්ෂා කර මුළු රාත්‍රිය පුරාම උන්වහන්සේගේ ආලෝකය බැබලෙමින්, උන්වහන්සේ තුළ ඊශ්‍රායල්වරු ආරක්ෂා සහිතව සිටියෝය.

ප්‍රිය සහෝදර සහෝදරියනි, ස්වාමීන් වහන්සේ ඔබ ඉදිරියෙන් ගමන් කරන සේක. ඔබගේ රළු තැන් උන්වහන්සේ සමතලා කරන සේක. ඔබ පසුපස උන්වහන්සේගේ අභිමුඛත්වය ගමන් කරනවා ඇත.

යුධ ජාතිකයෙකුගේ කුඩා කතාන්දරයක් මෙලෙස සඳහන් කරමි;

'එක්තරා පියෙක් තම පුතා සමග පාළු තැනි පාරක ගමන් කරමින් සිටින විටදී ඔවුන්ට පහර දීමට සොරෙක් පැමිණුනේය. එවිට පියා තම පුතාව පිටුපසට දමා ඔහුව ආරක්ෂා කළේය. නැවත ඔවුන් ගමන් කරන විටදී තවත් ස්ථානයකදී සතුරෙක් ඔවුන්ට පිටුපසින් පැමිණෙනු අතර පියා පුතාව ඉදිරියට දමා ඔහු පසුපසට ගියේය. සතුරු උවදුර නමැති බාධාව දෙපසින්ම පැමිණුන විටදී මෙම පියා තම පුතාව කර මත උසුලාගෙන ගමන් කළේය.'



*The father lifted his son onto his shoulders and carried him to safety*

මේ ආකාරයෙන්ම අපගේ ස්වර්ගය පියාණන්වහන්සේ අපව ද ආරක්ෂා කරයි. අප ඉදිරියෙන් යන්නට අවශ්‍ය වන්නේ කුමන අවස්ථාවේදී ද, අප පිටුපසින් යන්නට අවශ්‍යය කුමන අවස්ථාවේදී ද අපව උසුලාගෙන යා යුත්තේ කුමන අවස්ථාවේද කියා උන්වහන්සේ හොඳින්ම දනී.

එබැවින් අපගේ ජීවිතය උන්වහන්සේට භාර දෙමු. අපගේ සියලුම සටන්වලදී උන්වහන්සේ සටන් කරයි. උන්වහන්සේ සේනාවල ස්වාමීන්වහන්සේයි.

අප ආලෝකය දෙන පිණිස අප තුළ ආලෝකය බැබළිය යුතුයි!



***He calls us to be light-bearers in this dark world***

ස්වාමීන් වහන්සේ අපගේ ආලෝකයයි. නමුත් උන්වහන්සේ අපව කැඳවන්නේ උන්වහන්සේගේ ආලෝකය දරමින් අඳුරු ලෝකයට අප ආලෝකයක් වන පිණිසයි.

*''නුඹුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනැත්තවහන්සේගේ උත්කෘෂ්ඨතාවය දක්වන පිණිස..........'' (1පේතෘස් 2:9) ''එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබලාවා.'' (මතෙව් 5:16)*

අපගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ යහපත්කමත් සත්‍යතාවයත් අප පාවිච්චි කරන වචන තුළින් හා ක්‍රියා තුළින් අන් අයට ප්‍රකාශ කළ යුතුයි. අන් අය ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය අපගේ දයාවන්තකම හා යහපත් ක්‍රියා තුළින් දකින පිණිස අප ක්‍රියා කරමු.

ප්‍රිය මිතුවරුනි, 2026 වන වර්ෂයේදී ඔබ උදෙසා කුමක් තබා තිබෙනවාද කියා ඔබ නොදැන සිටින්නට පුළුවනි. නමුත් ඔබගේ අනාගතය දරා සිටින්නා වූ දෙවියන්වහන්සේව ඔබ විශ්වාස කරන්න.

....Contd. to page 10

ECHO OF HIS CALL
REACHING NATIONS
SINCE 1969
1969 TO 2029
NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Qualification : 10th Standard & above
Rush for admission! Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 56 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

''...කියවන්නා තේරුම් ගනීවා....'' *(මතෙව් 24:15)*

## තේජාවන්විත දෙවියන්වහන්සේ !

*රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ට රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිලයේ ලැබුවහුය. නොමිලේ දීපල්ලා.'' (මතෙව් 10:8)*



මගේ සේවා කාලය තුළදී දෙවියන් වහන්සේ බොහෝ හාස්කම් හා ආශ්චර්යමත් දේ කළෝය. එපමණක්ද නොව දෙවියන් වහන්සේගේ ශුද්ධවූ දේවදූතයන් ලවා මට ඉතාමගේ අත්‍යාවශ්‍යතා තිබෙන අවස්ථාවන්වලදී උන්වහන්සේ මට උපකාර කළේය. මා දෙවියන්වහන්සේගේ බලය මහත් ලෙස අත් දුටිමි. මා අඩගසන සෑම මොහොතේම උන්වහන්සේ මට උත්තර දෙමින් මට ආශිර්වාද කළේය.

1993 වන වර්ෂයේදී චෙන්නෙයිවල සිට කිලෝ මීටර් 35 ක් පමණ දුරින් රෝස් මේරි නම් එක්තරා කාන්තාවක් සිටියාය. යක්ෂ ආත්මයක් ආවේශ වීම කරණ කොටගෙන ඇය මහත්සේ පීඩා විඳිමින් දුක් වින්දාය. ඇයට කෑම ගැනීමට හෝ නිදා ගැනීමට නොහැකිව සිටියාය. ඇගේ පවුලේ සියලු දෙනාවම ඇය විසින් මරා දමන බව ප්‍රකාශ කරමින් බිය කළාය. ඇයද බොහෝ අවස්ථාවන් වලදී දිවි නසා ගැනීමට උත්සාහ කළාය. ඇයව පාලනය කිරීමට බැරි නිසා ඇගේ අත්පා ගැටගසා වෙනම කාමරයක ඇයව දමා තිබුණාය.

ඇයට යාච්ඤා කිරීමට ඇගේ පවුලේ අය මා හට කතා කළ විටදී ඒ පිළිබඳව මහත් බරක් ඇතුව යාච්ඤා කරමින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම ලබාගෙන එම පවුල සිටින ස්ථානයට මා ගියෙමි. මා නිවසින් පිට වෙනවාත් සමගම යක්ෂ ආත්මයේ බලපෑම මට මහත් සේ දැනුණි. මා එම නිවසට යාමට පෙර බොහෝ පීඩනයට මුහුණ දීමට සිදුවිය.

මා එම නිවසට ගිය විට ඇයව බැඳ තිබූ බැමි ගලවා දමන්නය කියා එම පවුලේ අයට මා පැවසුවෙමි. එවිට ඔවුන් ඇයව බැඳ තිබූ බැමි වලින් නිදහස් කළ පසු ඇය අසභ්‍ය වචන කතා කරමින් එහාට මෙහාට දුවන්නට පටන් ගත්තේය.

මා දෙවියන් වහන්සේ තුළ ඉතා ලාබාල වූවත් නපුරු ආත්මයට විරුද්ධව යාච්ඤා කිරීමට දෙවියන් වහන්සේ මා හට බලය ලබා දුන්නේය. මා මගේ මුළු විශ්වාසයම ස්වාමීන්වහන්සේ පිට තබා එම යක්ෂ ආත්මයට ඇගෙන් පිටවන පිණිස අණ කළෙමි. එවිට ඈ තවත් උග්‍ර වූවාය. ඇය වහලයේ ඇති බාල්කයේ එල්ලී අවට සිටි අයට පයින් ගැසීමට පටන් ගත්තේය. කිසිවකුට ඇයව නැවැත්වීමට නොහැකි විය. තවත් අය පැමිණ පුදුම වී බලා සිටියාය. නමුත් ඒ අවස්ථාවේදී මා දෙවියන් වහන්සේගේ බලය අත්දුටුවෙමි. නැවත මා යක්ෂ ආත්මයට අණ කරමින් ''මේ කාන්තාවගේ ජීවිතයට නුඹට කිසි අයිතියක් නැහැ, නාසරිය යේසුස් වහන්සේගේ නාමයෙන් නුඹ ඇයව අත්හරින්න.'' ය කියා පැවසුවෙමි. මා යේසුස්වහන්සේගේ නාමයෙන් අණ කෙළෙමි. එම වචන කියා මා යාච්ඤා කළ කල්හි එම යක්ෂ ආත්මය කෑ ගසා ඈ තුළින් පහව ගියාය. ඇය මළ මිනියක් ලෙස බිම ඇද වැටුණි.

ඉන්පසු මා ඇයට අත තබා යාච්ඤා කළ පසු ඇයට සිහිය ලැබුණේය. එවිට එහි සිටි සියලු දෙනාම ඉතා පුදුමයට

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Men's Prayer : 7.30 p.m. Friday
25. Discipleship Meeting : 6.00 p.m. Saturday
26. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
27. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
28. Ministers' Meeting : 5.30 p.m. First Saturday
29. Parents' Prayer : 4.00 p.m. First Sunday
30. Night Prayer : 9.30 p.m. Third Friday
31. Fasting Prayer : 9:30 a.m. Second Saturday
32. Holy Communion : Second Sunday Service
33. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
34. Staff Devotion : 9.00 a.m. daily
35. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

පත්විය. එම මොහොතේ පටන් ඇය මිදීම ලබා ඇගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ සමග ගමන් කිරීමට ආරම්භ කළේය.

ප්‍රිය මිතුය, මෙම යේසුස්වහන්සේ ඔබටත් මෙලෙස හාස්කම් කිරීමට අදත් ජීවමානව සිටී. ඔබගේ ජීවිතයේ මුහුණ දෙන ඕනෑම අමාරු අවස්ථාවකදීම ඔබට හාස්කමක් කිරීමට අදටත් උන්වහන්සේට පුළුවනි. යේසුස් වහන්සේවහන්සේගෙන් ඔබගේ පාපයන්ට සමාව ගෙන උන්වහන්සේව අනුගමනය කරන්න.

ස්වාමින්වහන්සේ මාව ලෝකයේ බොහෝම ස්ථානවලට ගෙන ගොස් හාස්කම් සහ අඩයාලම් කරමින් උන්වහන්සේගේ වචනය ස්ථිර කරන පිණිස ගෙන ගියේය. උන්වහන්සේ ඔබගේ ජීවිතයේද හාස්කම් කරයි. උන්වහන්සේ ඔබට බොහෝ සේ ප්‍රේම කරයි. උන්වහන්සේට ඔබව අවශ්‍යයි.

මාගේ මිතුය, දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබට වේවා!

*************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

*....Contd. from page 7*

බිය නොවන්න, ස්වාමීන්වහන්සේගේ ආලෝකය ඔබගේ ජීවිතේ සෑම ස්ථානයකදීම බැබළේවා!

*හෙට දවස ගැන කනස්සලට පත් නොවන්න.*

*''........හෙට දවස ඒ ගැනම කරදර වන්නේය .........'' (මතෙව් 6:34)*

ඔබගේ වේදනාව කරදරය අද දවසේ කුමක් වුවත් යේසුස් වහන්සේ ලෝකයේ ආලෝකය බව මතක තබාගන්න. ඔබගේ ජීවිතයේ තිබෙන බය ඉවත්කර, යේසුස් වහන්සේගේ ආලෝකය බබලවන්න.

ඔබගේ ජීවිතය ඔබ දකින අන්ධකාරයට වඩා උන්වහන්සේගේ ආලෝකය බලවත්ය. ඔබගේ කරදරයට වඩා උන්වහන්සේගේ සමාදානය බලවත්ය. ඔබට ඇතිවන සෑම විරුද්ධතාවයන්ට වඩා දෙවියන්වහන්සේගේ බලය බලවත්ය.

*''මක්නිසාද ජීවනයේ උල්පත ඔබ සමගය. ඔබගේ එළියෙන් අපි එළිය දක්නෙමුව.'' (ගීතාවලිය 36:9)*

************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor


# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.



Our address :

ECHO OF HIS CALL

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS Patrika Channel"**

**on 2nd DECEMBER 2025.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

P.O. Box No. 2957,

Chepauk, Chennai - 600 005, INDIA.

Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766


***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**